**SAMODHANA JOURNAL**
Faculty of Social Sciences and Humanities,
Rajarata University of Sri Lanka,
Mihintale

2023 Volume 12 Issue I

# Examining the Mahaweli Movement in Sri Lanka: An Investigative Study.

**D.J.K. Ihalagedara[1]***

Received Date: 25th January 2024
Accepted Date: 28th February 2024
Published Date: 06th March 2024

## Abstract

After the fifteenth century, the attention of Western nations was focused on Sri Lanka, and thus, there were clear changes in the settlement pattern of Sri Lanka. At the beginning of British rule in this country, there was a broken form of agriculture and irrigation industry in the Rajara civilization. By the beginning of the 19th century, the dry zone had become a depopulated area, and various problems had arisen in the humid zone due to the migration of people to the southwest humid zone. The primary focus of British rule was on projects that brought revenue to the government. Among them, the plantation economy was a priority. After the establishment of the North Central Province in 1973, the British cultivated agriculture following the reconstruction of roads, which resulted in the establishment of farming colonies in the dry region. From the middle of the nineteenth century, people from other areas were brought to the dry region, and attempts were made to start settlements, but for various reasons, these efforts were unsuccessful. After 1948, the government's main objective became the dry zone's repopulation. For that, the primary objective was to develop agriculture by diverting the Mahaweli River to the dry zone, and as a result, the birth of the Mahaweli movement can be identified. The Mahaweli movement in Sri Lanka

---

[1]*Department of Humanities, Rajarata University of Sri Lanka, Mihintale, 50300, Sri Lanka.*
*hettiarachchi@ssh.rjt.ac.lk*

can be identified as a multi-purpose project that was implemented in a planned manner to overcome the structural weaknesses of the old agrarian movement. Although the basic plan was to start the Mahaweli movement in the 1970s and complete it by 2000, after 1977, plans were made for an accelerated Mahaweli movement to be completed in six years. The reasons that led to the failure of the old colony movement were studied, and as a solution, efforts were made to implement the new agrarian movement under the Mahaweli movement. Under the Mahaweli movement in Sri Lanka, the Mahaweli zones were classified and developed from A to M, which was the initial step in Sri Lanka.

**Keywords**: Mahaweli Movement, Settlement Pattern, Colony Movement, Repopulation.

## හැඳින්වීම

පහළොස් වැනි සියවසින් පසු බටහිර ජාතීන්ගේ අවධානය මෙරට කෙරෙහි යොමු වූ අතර ඒ සමඟින් ජනාවාස ව්‍යාප්ති රටාවෙහි පැහැදිලි වෙනස්කම් සිදු විණි. මෙරට බ්‍රිතාන්‍ය පාලනය ආරම්භ වන කාලපරිච්ඡේදය වන විට රජරට පැවතියේ කෘෂිකර්මාන්තයේ සහ වාරිකර්මාන්තයේ බිඳ වැටුණු ස්වරූපයකි. 19 වැනි සියවස ආරම්භය වන විට වියළි කලාපය ජනශූන්‍ය ප්‍රදේශයක් බවට පත් ව තිබූ අතර ජනතාව නිරිතදිග තෙත් කලාපවලට විතැන් වීමත් සමඟ තෙත් කලාපය තුළ ජනගහනයේ ඉහළ යාම, ඉඩම් ගැටලු, ආහාර හිඟතාව, නිවාස නොමැති වීම, රැකියා ගැටලු ආදි ගැටලු ගණනාවක් ඇති විය.

බ්‍රිතාන්‍ය පාලනයේ මූලික අවධානය යොමු වූයේ රජයට ආදායම් ගෙන දෙන වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ආදි ව්‍යාපෘති කෙරෙහි ය. 1873 උතුරුමැද පළාත පිහිටුවීමෙන් පසු බ්‍රිතාන්‍ය පාලකයන් කෘෂිකර්මාන්තය නඟා සිටුවීම උදෙසා වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ආදි ප්‍රතිපත්ති කෙරෙහි යොමුවීමේ පියවරක් ලෙස වියළි කාලපයේ ජනපද පිහිටුවීම පෙන්වා දිය හැකි ය.

19 සියවසේ මැද භාගයේ සිට වෙනත් ප්‍රදේශවලින් ජනතාව ගෙනවිත් වියළි කලාපය ජනාවාස කළ යුතු බවටත්, එමඟින් කෘෂිකර්මාන්තය නඟා සිටු විය යුතු බවටත් අදහස් ඉදිරිපත් විය. මේ අනුව නුවරකළාවියේ කළාවැව ජනපදය, නාච්චාදූව, ඉරණමඩු කරච්චි ජනපදය, තබ්බෝව, පස්දුන් කෝරලේ සහ වලවේ වම් ඉවුර ජනපද ආරම්භ කළ අතර මෙම ජනපද ආරම්භ කිරීමේ මුල් පියවර අසාර්ථක බව

පෙනී යයි. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වූ අතර මෙමගින් කෘෂි කර්මාන්තය නැවත නගා සිටුවිය යුතු බවටත් වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කොට ගොවි ජනතාවට විවිධ සහන ලබා දිය යුතු බවටත් සලකන ලදී. මේ අනුව මෙරට ලබා ඇති ගමනාගමන පසුකම් ආදිය සැලකිල්ලට ගෙන වියළි කලාපයේ නැවත ජනපද ආරම්භ කළ යුතු බවට වූ අදහසකට අනුව මින්නේරිය, කාගම, නාච්චාදූව ජනපද ආරම්භ කරන ලදී.

1948න් පසු රජයේ ප්‍රධාන අරමුණ වූයේ වියළි කලාපය නැවත ජනාවාස කිරීමයි. ඒ සඳහා මහවැලි ගඟ වියළි කලාපයට හැරවීමෙන් කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරීම මෙහි මූලික අරමුණ වූ අතර එහි ප්‍රතිඵලයක් වනුයේ මහවැලි ව්‍යාපාරයයි. මෙරට ගොවිජනපද ව්‍යාපාරයේ මෙතෙක් පැවති ව්‍යුහාත්මක දුර්වලතා මඟ හරවා සැලැසුම් සහගත ව ක්‍රියාත්මක කළ බහුකාර්ය ව්‍යාපෘතියක් ලෙස මහවැලි ව්‍යාපාරය හඳුනාගත හැකි ය (මහවැලි ව්‍යාපාරය හා අරමුණු 1998:27). මහවැලි ව්‍යාපාරය 1970 ආරම්භ කොට 2000 වසර වන විට අවසන් කිරීම මූලික සැලැසුම විය. 1977 වසරෙන් පසු කඩිනම් මහවැලි ව්‍යාපාරය ලෙස වසර 6 කින් නිම කිරීමට සැලැසුම් කරන ලදි (මහවැලි ව්‍යාපාරය හා අරමුණු 1998: 26). ඒ අනුව 1978 වර්ෂයේ දී කඩිනමින් මහවැලි යෝජනා ක්‍රමය ආරම්භ විය. කඩිනම් මහවැලි යෝජනා ක්‍රමය බහුවිධ ව්‍යාපෘතියකි. පැරණි ජනපදවල අසාර්ථකත්වයට තුඩුදුන් හේතු අධ්‍යයනය කොට ඒවාට විසඳුම් ලෙස මහවැලි ව්‍යාපාරය යටතේ නව ගොවිජනපද ව්‍යාපාරය ක්‍රියාත්මක කිරිමට උත්සාහ ගත් අතර මහවැලි කලාප ඒ සිට එම් දක්වා කලාපවලට වර්ගීකරණය කොට සංවර්ධනය කිරීම ආරම්භක පියවර විය.

## අධ්‍යයන අරමුණ

නිදහස් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයේ මූලික අරමුණක් ලෙස මහවැලි ගඟ වියලි කලාපයට හරවා කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරීම පෙන්වා දිය හැකි ය. මේ අනුව 1958 පමණ වන විට මහවැලි ගඟ සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ අවශ්‍යතාව රජයන් විසින් හඳුනාගෙන තිබිණි. ආරම්භයේ දී අක්කර 325,000කට ජලය සැපයීමටත් මෙගාවොට් 260 ජල විදුලි නිෂ්පාදනයක් නිපදවීමටත් සැලසුම් සකස් කර තිබිණි. එහෙත් මූල්‍යමය වශයෙන් මෙරට පැවති ගැටලු තත්ත්වයන් යටතේ මෙම ව්‍යාපෘතිය නතර කිරීමට සිදු විය. මහවැලි සංවර්ධන ව්‍යාපාරය කඩිනම් කිරීමේ මූලික පරමාර්ථයක් වූයේ රට තුළ කෘෂිකාර්මික ප්‍රගතියක් ඇති කරලීමයි. මේ අනුව මහවැලි ගොවියාගේ ආදායම් තත්ත්වය කඩිනමින් ඉහළ

දැමීමත් සමස්ත ශ්‍රී ලංකාවේ ජනතාවට ආහාර නිෂ්පාදනයක් සැපයීමත් මහවැලි ව්‍යාපාරයේ මූලික අරමුණු විය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

### *මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය*

1968 දී ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් අවුරුදු 30කින් නිම කිරීමට සැලසුම් කර තිබූ මහවැලි යෝජනා ක්‍රමය යටතේ එනම් මහවැලි මහ සැලැස්මට අනුව මහවැලි වාරි කලාප 13කට අයත් පැරණි ඉඩම් හෙක්ටයාර් 110,404ක් සහ අලුත් ඉඩම් හෙක්ටයාර් 253,968ක් වශයෙන් මුළු ඉඩම් හෙක්ටයාර් 364,372ක් සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබූ අතර මහවැලි ප්‍රදේශයේ ජල විදුලි බලාගාර 16ක් තැනීමට සැලසුම් කර තිබිණි (මහවැලි ව්‍යාපාරය හා අරමුණු 1998: 29). ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් අවුරුදු 30කින් නිම කිරීමට සැලසුම් කළ මහවැලි යෝජනා ක්‍රමය 1977 දී බලයට පත් එක්සත් ජාතික පක්ෂ රජය විසින් කෙටි කාලයකින් නිම කරීමේ කඩිනම් වැඩපිළිවෙළක් බවට පත් කරන ලදි. කඩිනම් මහවැලි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී මුල් සැලසුමේ තිබූ මොරගහකන්ද ජලාශය ඉදි කිරීමේ කටයුතු කඩිනම් වැඩපිළිවෙළට ඇතුළත් නොකරන ලදි. කඩිනම් මහවැලි යෝජනා ක්‍රමය අංශ 03කින් ක්‍රියාත්මක වේ.

01. කොත්මලේ, වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ, මාදුරුඔය, උල්හිටිය, රත්කිඳ යන ජලාශ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

02. ඇළ මාර්ග සංවර්ධනය, මහාමාර්ග සංවර්ධනය සහ ඉංජිනේරු කටයුතු

03 ගොවි පවුල් පදිංචි කරවීම සහ නිෂ්පාදන කටයුතු

මෙම කඩිනම් මහවැලි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ස්වීඩනය, එක්සත් රාජධානිය, බටහිර ජර්මනිය, ඉතාලිය, ජපානය, කැනඩාව, ස්විස්ටර්ලන්තය වැනි රටවල් සහ ලෝක බැංකුව ණය සහ ආධාර සැපයූ අතර එම රටවල සමාගම් විසින් කොන්ත්‍රාත් කටයුතු කරන ලද අතර උපදේශක සේවාවන් ද සපයන ලදි. මහවැලි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී මහවැලි බල ප්‍රදේශය තුළ පදිංචි කරන ගොවි පවුලක් සඳහා මඩ ඉඩම් අක්කර 02ක් සහ නිවහනක් සාදා

ගැනීම සඳහා ගොඩ ඉඩම් අක්කර 1/2 වශයෙන් අක්කර 02 1/2 බැගින් බෙදා දෙන ලදි (මහවැලි ගඟ සංවර්ධන ව්‍යාපාරය එදා අද සහ හෙට, 1998: 16). ඊට අමතර ව ගොවීන්ට අවශ්‍ය නිවසක් සාදා ගැනීම සඳහා උපකාරි වීම සහ අවශ්‍ය ණය පහසුකම් සපයා දෙන ලදි. මේ යටතේ පැරණි ගොවි ජනපද ව්‍යාපාරවල අසාර්ථක අත්දැකීම් පදනම් කර ගනිමින් එම අසාර්ථකත්වයට බලපෑ හේතුවලට පිළියම් යොදමින් මහවැලි ව්‍යාපාරය ක්‍රියාත්මක කරන ලදි. මේ අයුරින් මහවැලි ව්‍යාපාරය අදියර කිහිපයක් ඔස්සේ ක්‍රියාත්මක විය.

***මහවැලි මහ සැලැස්ම***

මහවැලි ගඟ සංවර්ධන ව්‍යාපෘතිය දෙවනවරට ආරම්භ වන්නේ 1963 දී ය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (United Nations Development Program - UNDP) සහ අහාර හා කෘෂිකාර්මික සංවිධානයේ (Food and Agriculture Organization - FAO) අනුග්‍රහය මත මහවැලි ගඟ සංවර්ධන ව්‍යපෘතිය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කොට එහි වාර්තාව රජයට ඉදිරිපත් කරන ලදි (මද්දුමබන්ඩාර, 1984:15). මෙය මහවැලි මහ සැලැස්ම (Master Plan) ලෙස හඳුන්වනු ලැබූ අතර ඒ යටතේ මහවැලි ගඟ වියළි කලාපයට හරවා එයින් බහුකාර්ය සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම බලාපොරොත්තු විය. ඒ යටතේ එම ව්‍යාපෘතිය 1970 දශකයෙන් ආරම්භ ව 2000 වසර තෙක් වසර 30කින් නිම කිරීම අපේක්ෂාව විය. ආරම්භයේ දී අක්කර 90,000කට වාරි ජලය සම්පාදනය කිරීමත් ජලාස 58ක් කේන්ද්‍ර කොට ගනිමින් සැතපුම් 250ක් පමණ ප්‍රධාන ඇළ මාර්ග ඉදි කොට ඒ යටතේ ගොවි පවුල් 25,000ක් පදිංචි කිරීම සැලසුම විය (මහවැලි ව්‍යාපාරය හා අරමුණු 1998: 27).

1970 දශකයේ දී මහවැලි ගඟ සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ වුව ද මේ කාලයේ සිදු වු දේශපාලනමය වෙනස්වීම් මත ව්‍යාපෘතියේ ආරම්භක අරමුණු ද සංශෝධනයට ලක් විය. එහි ප්‍රධාන සංශෝධනය වූයේ තිස් අවුරුදු සැලැස්ම වසර හයකින් නිම කිරීමේ කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපෘතියයි. 1977 වන විට පැවති තත්ත්වයන් මත සංවර්ධන යෝජනා ක්‍රමය කඩිනම් කිරීමේ අවශ්‍යතාව පැවති රජය වටහා ගෙන තිබිණි. මේ වන විට මෙරට මුළු ආනයන 40%ක් පමණ ආහාර සඳහා වැය වූ අතර ශ්‍රම බලකායෙන් රැකි රක්ෂා නොමැති ප්‍රමාණය දශලක්ෂය ඉක්මවා තිබිණි (මහවැලි ව්‍යාපාරය හා අරමුණු 1998: 30). මෙවන් පසුබිමක් මත මහවැලි ව්‍යාපාරය වඩාත් කඩිනම් කිරීමේ අවශ්‍යතාව රජය තේරුම් ගෙන තිබිණි.

මහවැලි මහ සැලැස්ම යටතේ තිබූ ඒ සිට එම් දක්වා වූ මහවැලි කලාප වෙනුවට තෝරාගත් එච්, බී සහ සී කලාප සංවර්ධනය කිරීම ප්‍රථම ඉලක්කය විය. මේ සඳහා නෙදර්ලන්ත රජයේ (Netherland Engineering Consultancy Firm - NEDCO) අයතනයක් මඟින් 1977 දී කඩිනම් මහවැලි සංවර්ධන යෝජනාවලිය රජයට බාර දුන් අතර 1978 දී එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ විණි (මහවැලි ව්‍යාපාරය හා අරමුණු 1998: 34). කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ සුවිශේෂී අරමුණක් ලෙස මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පැවති මහවැලි එච් කලාපය සංවර්ධනය කිරීම පෙන්වා දිය හැකි ය. කඩිනම් මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය වියළි කලාපයේ මුළු භූමි ප්‍රමාණයෙන් 40%ක් ආවරණය වන පරිදි යෝජනා වූ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ සමාජ හා ආර්ථික ව්‍යුහීය පරිවර්තනයන් රැසකට තුඩු දෙන ලැබී ය. විශේෂයෙන් ම 1960 දශකයේ මෙරට හඳුන්වා දුන් හරිත විප්ලවයේ බලපෑම මත කෘෂිකාර්මික නවීකරණයක 'ද මහවැලි සංවර්ධන සැලැස්ම හා බද්ධවීම තුළින් එහි ගමන්මඟ වේගවත් විය.

ගංගා නිම්න සංවර්ධනය යටතේ පසු විජිත ශ්‍රී ලංකාවේ වාරිමාර්ග ක්ෂේත්‍රයෙහි බහුකාර්ය ව්‍යාපෘතියක් ලෙස පොල්ගොල්ල අසලින් මහවැලි ගඟ හැරවීමෙන් වියළි කලාපය පෝෂණය කිරීමත් එමඟින් නව ජනාවාසකරණ කටයුතු ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කිරීමත් පෙන්වා දිය හැකි ය. මේ පිළිබඳ මූලික අධ්‍යයන 1950 දශකයේ සිට ක්‍රියාත්මක වූ අතර මේවා විදේශීය සම්බන්ධතා හා කාර්මික සහයෝගිතාව ලබාදෙන වැඩපිළිවෙළ සහ බද්ධ වීමක් මෙම කාලපරිච්ඡේදය තුළ දක්නට ලැබේ.

මෙරට ස්වාභාවික සම්පත් අතරින් සුවිශේෂී ස්ථානයක් ගන්නා ගංගා නිම්න කේන්ද්‍ර කරගනිමින් බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම කෙරෙහි වාරිමාර්ග දෙපාර්තමේන්තුව නැඹුරු ව සිටි 1950 සිට 1960 දක්වා වූ දශකය මෙරට වැදගත් කාලපරිච්ඡේදයක් ලෙස හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම මෙරට විදේශ ප්‍රතිපත්තියේ පැහැදිලි වෙනස්කම් සිදු වු අවධියක් ලෙස 1950 මැද භාගය සැලකිය හැකි ය. 1956 සමගි පෙරමුණු රජය මඟින් හඳුන්වා දෙනු ලැබූ නොබැඳි විදේශ ප්‍රතිපත්තිය මඟින් මෙරට හා ජාත්‍යන්තරය අතර මෙයට පෙර නොවූ අකාරයේ සබඳතා වර්ධනය වීමක් හඳුනාගත හැකි ය. එහි වැදගත් අවස්ථාවක් වූයේ විදේශයන් සමඟ කාර්මික සහයෝගිතා ගිවිසුම් කිහිපයකට මංපෙත් විවර වීමයි. ඒ අනුව සැලසුම් සම්පාදනයේ දී විදේශයන් හා පැවති සබඳතා උපයෝගි කොට ගැනිමින්

ගංගා නිම්න සංවර්ධනය කිරීමත් එමගින් බහුකාර්ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත් අවස්ථාව උදා කරගන්නා ලදි. මෙහි ප්‍රතිඵලයක් ලෙස වාරිමාර්ග දෙපාර්තමේනතුව වෙනත් බාහිර ආයතන හා සම්බන්ධ ව ගංගා නිම්න ආශ්‍රිත අධ්‍යයන සහ ශක්‍යතා වාර්තා පිළියෙල කිරීම ආරම්භ කරන ලදි. මෙම අධ්‍යයන සහ ශක්‍යතා වාර්තා පිළිබඳ සාකච්ඡා කිරීමේ දී කැලණි ගඟ ජල ගැලීම් පාලනය හා සම්බන්ධ ව ජල විදුලි හා වාරිමාර්ග කටයුතු සංවර්ධනය සම්බන්ධ අධ්‍යයනය ප්‍රථමයෙන් වැදගත් වේ. 1958 සෝවියට් සහයෝගිතා මිත්‍රත්ව ගිවිසුම යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා එක් ව ටෙක්නෝ ප්‍රොමෙක්ස්පෝට් (Techno Promexport) නම් රුසියානු සමාගමක් මඟින් මෙම අධ්‍යයනය සිදු කර 1962 දී එළිදක්වන ලදී (Mahaweli stastical handbook 2001:13). මීට අමතර ව මල්වතු ඔයේ පහළ නිම්නයේ අධ්‍යයන සහ ශක්‍යතා වාර්තා සොවියට් සමූහාණ්ඩුව හා ඒකාබද්ධ ව සිදු කළ අතර, වළවේ නිම්නයේ සමනල වැව වාර්මාර්ග හා ජල විදුලි යෝජනා ක්‍රමය ඇමරිකා එක්සත් ජනපදයේ කොලරාඩෝ හයිඩ්‍රෝටෙක්නික් (Hydrotechnic) ආයතනය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව එක් ව 1952 සිදු කර ඇත (Mahaweli stastical handbook 2001:13)..

1950 දශකයේ අග භාගයේ පටන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව පොල්ගොල්ල ප්‍රදේශයෙන් මහවැලි ගඟ වියළි කලාපයට හැරවීම පිළිබඳ මූලික අධ්‍යයන සිදු කර ඇත. ප්‍රධාන වශයෙන් වාරිමාර්ග සහ විදුලි බලය නිෂ්පාදනය කිරීම යන බහුකාර්ය අරමුණු පෙරදැරි කරගනිමින් මහවැලි ගංගා නිම්න සංවර්ධන ප්‍රතිපත්තිය රජයේ ප්‍රමුඛ සංවර්ධන කාර්යයක් ලෙස හඳුනා ගන්නා ලදි. මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා ශ්‍රි ලංකා රජය 1958 පෙබරවාරි 07 දින එක්සත් ජනපද කාර්යක්ෂම දූත මණ්ඩලය (USOM) එක් ව ගිවිසුමකට එළඹෙන ලදි (Mahaweli stastical handbook 2001:16). මෙම අධ්‍යයනය වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා එකාබද්ධ ව සිදු කළ අතර මෙමගින් මූලික වශයෙන් මහවැලි ගඟ වාරිමාර්ග කටයුතු හා විදුලිබල උත්පාදනය සඳහා වියළි කලාපයට හැරවීම පිළිබඳ යෝජනා හා නිර්දේශ හඳුනාගන්නා ලදි.

මීට අමතර ව ශ්‍රි ලංකා රජය හා කැනඩා රජය ඒකාබද්ධ ව හන්ටින්ග්ස් (Huntings Coperation) එක් ව 1958 -1963 අතර කාලපරිච්ඡේද යටතේ මෙරට ස්වාභාවික සම්පත්, ඉඩම් හා ජලය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරන ලදි.

මෙම අධ්‍යනයේ විශේෂත්වය වනුයේ මෙරට මිනින්දොරු දෙපාර්තමේන්තුවේ සහයෝගය ද ලබා ගනිමින් ගුවන් සිතියම් විමර්ශනය කරමින් අධ්‍යයනය සිදු කිරීම ය.

***ජනාවාස ව්‍යාපාර සැලසුම් කිරීමේ සංකල්පයන්***

පැරණි ජනාවාස යෝජනා ක්‍රම බොහොමයක් ක්‍රියාත්මක වූයේ සීමිත ප්‍රදේශයක් තුළයි. ජනාවාස සැලසුම් කිරීමේ දී ප්‍රදේශයේ සම්පත් මුළුමනින් ම ප්‍රයෝජනයට නො ගැනිණි. අවට ඉඩම් හා මානව සම්පත්වලින් එම ජනාවාස පාරිබාහිර ව තැබීමට එය තුඩුදෙනු ලැබිණි. අවශ්‍යයෙන් ම සැලසුම් කළ යුතු ව තුබුණේ සම්පත් ඒකාබද්ධ ව සංවර්ධනය කිරීම ය. මේ අනුව බලන විට මහවැලි ජනාවාස සැලසුම වඩා ක්‍රමවත් ව සංවිධනය කොට ඇත.

මහවැලි සංවර්ධනය යනු ප්‍රදේශීය සංවර්ධනයේ ව්‍යාප්ත වූ වෑයමකි. මහවැලි ව්‍යාපාරයේ මූලික සංකල්පයක් වන ජනාවාස පිහිටුවීම සහ ඒ ආශ්‍රිත සමාජ ආර්ථික කටයුතු පුළුල් ව විහිදෙන ආකාරයට සම්බන්ධ කිරීමේ අවශ්‍යතාව මහවැලි සැලසුම් සකස් කිරීමේ දී හඳුනාගෙන තිබිණි. ඒ යටතේ යටිතල පහසුකම් දියුණු කිරීම, ජාතික මහාමාර්ග පද්ධතියට සම්බන්ධිත ව සැලසුම් සහගත මාර්ග පද්ධතියක් සකස් කිරීම, දැනට ඇති ප්‍රදේශීය නගර නව නගර බවට පත්කීරීම ප්‍රධාන ඒවා සංධිස්ථාන වශයෙන් සංවර්ධනය කිරීම ඉඩම් සංවර්ධනය ආදි කාර්යයන් සැලසුම් සහගත සංවර්ධන වැඩසටහන් අතර කීපයකි.

ජනාවාස සැලසුම් කිරීමේ දී බලපාන ලද තවත් සංකල්පයක් වනුයේ සංවර්ධනය සඳහා ලබාගත හැකියි ඉඩම්වලින් උපරිම ප්‍රයෝජනයක් ලබාගෙන වාරිමාර්ග පද්ධතිය සැලසුම් කිරීමයි. මීට අදාළ ව ගැමි ජීවිතය සම්බන්ධයෙන් කරන ලද සමාජ විද්‍යාත්මක පර්යේෂණවලින් සහ පැරණි ජනාවාස යෝජනාක්‍රමයන්ගෙන් ලබාගත් අත්දැකීම් මගින් ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී එහි යෝග්‍යතාවන් සම්බන්ධයෙන් සැලකිලිමත් වී ඇත. ඒ යටතේ

(අ) වාරිමාර්ග ශ්‍රමය ඵලදායි වශයෙන් ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම.

(ආ) යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

(ඇ) ඉඩම් සංවර්ධනය කිරීම.

(ඈ) ප්‍රජා සංවර්ධනය හා හඳුනාගනු ලබන සංවර්ධන කටයුතු

ජනාවාස සැලසුම් කිරීමේ දී මෙලෙස හඳුනාගනු ලැබූ සංකල්පවලට අමතර ව ජනාවාස නිවාස පොකුරු ක්‍රමයට සකස් කිරීම (පොකුරු ගම්මාන ක්‍රමය වූ කලී පැරණි ජනාවාස යෝජනා ක්‍රමයන්හි අනුගමනය කරන ලද, තැනින් තැන විසිරී ගිය නිවාස ඉඩම් කට්ටි ලබාදීමේ ක්‍රමයෙන් වෙනස් වූවකි.) පැරණි ජනාවාස යෝජනා ක්‍රමයන්හි කටයුතු පරීක්ෂා කර බැලීමේ දී පෙනීයන්නේ ඉහත සඳහන් කරනු ලැබූ මූලික අවශ්‍යතාවන්ගෙන් බහුතර ප්‍රමාණයක් ඉටු වී නොමැති බවයි. එය ජනාවාසවල පදිංචිකරුවන්ගේ ප්‍රගතියට බධාකාරි වූ අතර පදිංචිකරුවන් විවිධ දුෂ්කරතාවන්ට මුහුණ පෑමට බලපෑ කරුණක් වී තිබිණි.

මහාමාර්ග, ඇළමාර්ග, ප්‍රජා ශාලා, සේවා මධ්‍යස්ථාන සහ තෝරාගත් ප්‍රදේශවලට විදුලිබලය සැපයීම මහවැලි ජනාවාස සංවර්ධන වැඩපිළිවෙළෙහි ප්‍රධාන අංග වේ. මෙම පහසුකම් ජනාවාස සැලසුම් කිරීමේ දී ජනපද පිහිටුවීමට පෙර සැපයිය යුතු වේ. එසේ නොමැති නම් ජනාවාස පිහිටුවා මුල් අවුරුදු කිහිපය තුළ සම්පූර්ණ කළ යුතු ය. මෙලෙස හඳුනාගනු ලැබූ සමාජ පහසුකම්වලින් වැඩි ප්‍රමාණයක් ජනාවාසකරුවන් ජනවාසවලට පැමිණීමට පෙර ලබා දිය යුතු ය යන්න පිළිගත් ප්‍රතිපත්තියකි (මහවැලි ව්‍යාපාර සහ අරමුණු, 1983:58).

මහවැලි ජනාවාස හා සම්බන්ධ පිළිගත් තවත් සංකල්පයක් වූයේ ජනපද තුළ බිහි වන නව ජනාවාස ක්‍රම ක්‍රියාකාරී වශයෙන් එකිනෙක හා සම්බන්ධ විය යුතු ය යන්නයි. මෙම සංකල්ප අරමුණු කොටගෙන නව ජනාවාස සැලසුම් කොට තිබේ. මහවැලි ගොවීන් වෙනුවෙන් ගෙවත්ත සඳහා හෙක්ටයාර් දෙකක (අක්කර භාගයක) ප්‍රමාණයක නිවාස වෙනුවෙන් ඉඩමක් ලැබෙන අතර මෙවැනි ඉඩම් කට්ටි ආසන්න වශයෙන් සියයකින් පමණ ගමක් නිර්මාණය වේ. මඩ ඉඩම් ලැබෙනුයේ ගමට ආසන්නයෙනි.

මෙවැනි පොකුරු ගම්මාන කිහිපයක් වෙනුවෙන් සේවා සැපයීම සඳහා ග්‍රාමීය මධ්‍යස්ථාන පිහිටුවිය යුතු ය. එම සේවා මධ්‍යස්ථාන අතර අරෝග්‍ය ශාලාවක්, ප්‍රාථමික කනිෂ්ඨ පාසලක්, ප්‍රජා සේවා මධ්‍යස්ථානයක්, සමුපකාර ශාඛාවක්, උපතැපැල් කාර්යාලයක්, ග්‍රාමීය ගබඩාවක් සහ බැංකු පද්ධතියක් ආදි ප්‍රජා අවශ්‍යතාවන් ඇතුළත් විය යුතු ය. මහවැලි එච් කලාපයේ නගර පිහිටුවීමේ සැලකිල්ලට ගන්නා ලද ජනාවාස සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව පෙනී ගොස් ඇති බැවින් නව සංවර්ධන ප්‍රදේශයන්හි නගර බිහි කිරීමේ දී පුළුල් ජනගහනයකට සේවා සැලසෙන සේ නගර බිහි කිරීමට තීරණය කොට තිබේ.

ජනාවාසකරුවන් වර්ග කිහිපයක් හඳුනාගත හැකි ය. ප්‍රථමයෙන් ම පදිංචි වන සහ නැවත පදිංචි වන්නන් ලෙස කොටස් දෙකකි. මුල් ම මහවැලි සංවර්ධන ව්‍යාපාර වූ වික්ටෝරියා, කොත්මලේ සහ රන්දෙණිගල වැනි ජලාශ ඉදිකිරීම වෙනුවෙන් තම නිජබිම් හා ජීවන මාර්ගයන් කැප කළ පවුල් සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින් ඔවුන්ට ඉඩම් ලබා දීමත්, ජීවන මාර්ග සලසා දීමත් නව මහවැලි ජනාවාස පිහිටුවීමේ දී මූලික අරමුණක් විය. ඉහතින් සඳහන් කළ ජලාශ වෙනුවෙන් ඉඩම් ලබා දුන් සමහර පිරිස් අහිමි වූ ඉඩම්වලට හිමි ඉඩම් ආසන්න ප්‍රදේශවලින් ලබාගෙන පදිංචි වීමට කැමැත්ත පළ කළ අතර තවත් පිරිසක් දුර බැහැර නව මහවැලි ජනාවාසයන්හි ඉඩම් ලබාගැනීමට කැමැත්ත පළ කළහ. මහවැලි ජනාවාස ව්‍යාපාරයන්හි සංවර්ධන කටයුතු සඳහා පවරා ගන්නා ඉඩම්වල පදිංචිව සිටි තවත් සමහර පදිචිකරුවන්ට අවශ්‍ය වූයේ නැවත සංවර්ධනය කරන ලද ඉඩම්වල හිමිකම ලබාගැනීමටයි.

තවත් හඳුනාගනු ලැබූ ජනාවාසකරුවන් පිරිසක් ලෙස මහවැලි සංවර්ධන ව්‍යාපාරයට පිටත ප්‍රදේශවලින් තොරාගැනීමේ ක්‍රම අනුව ජනාවාසවල පදිංචි කරවනු ලැබූ පිරිසයි. මෙම ජනාවාසකරුවන් සමාජීය වශයෙන් විවිධ ධූරාවලීන්ට අයත් වූ පිරිසක් වූ අතර එක සමාන භූගොලීය ලක්ෂණවලින් තොරාගනු ලැබූ මොවුන් එක සමාන සමාජ පසුතලයක් ඇති ජනාවාසකරුවන් කණ්ඩායමක් ලෙස පදිංචි කරවීමට හා ඔවුන්ට එක ම ප්‍රදේශයකින් (යායකින්) වගා ඉඩම් ලබා දීමට කටයුතු කොට තිබේ. නව ජලාශ ඉදිකිරීමේ දී ස්වකීය ඉඩකඩම් අහිමි වු පිරිස් වෙනුවෙන් ඉඩම් ලබා දීමේ දී ප්‍රමුඛතාව ලබා දී තිබේ.

මෙලෙස පිහිටවනු ලැබූ නව ජනාවාස ප්‍රදේශයන්හි කෘෂිකාර්මික නොවන වෘත්තීන් විශාල ප්‍රමාණයක් ඇති වෙනු යන බලාපොරොත්තුව නව ජනාවාස පිහිටුවීමේ දී අරමුණු කොට ගෙන තිබිණි. මෙහි මූලික අදහස ජනාවාස ස්වයං ක්‍රියාකාරි තත්ත්වයකට පත් ව සංවර්ධන ශක්තියක් බිහි කර ගත යුතු ය යන්නයි. ඉඩම් සංවර්ධනය කිරීමේ දී ජනාවාසකරුවන්ට අවස්ථාව සලසා දීමේ දී ප්‍රමුඛතාව ලබා දී ඇත. අසල්වැසි ජනාවාසකරුවන් සමඟ තම ශ්‍රමය යොදා ඉඩම් සංවර්ධනය කිරීමේ දී ඊට සහභාගී වීමෙන් අලුතින් තමන්ට හිමි වූ ඉඩම සමඟ තමන්ට අයිති සමාජය කෙරෙහි කිසියම් අයිතිවාසිකමක් ඇති බවට වූ හැඟීමක් නිර්මාණය කිරීම මෙහි අරමුණ විය. ආරම්භයේ දී ජනාවාසවලට ගෙන එනු ලැබුයේ තෝරාගනු ලැබූ ජනාවාසකරුවන් පමණි. ප්‍රථමයෙන් ම ඔවුන් කඳවුරක පදිංචි විය යුතු ය. දෙවනුව

සංවර්ධන කටයුතුවල දී ගෙවීම් මත හෝ වෙනත් අධාර මත තම ශ්‍රමයේ දායකත්වය ලබා දිය යුතු ය.

මෙම වැඩපිළිවෙළෙහි අරමුණ වූයේ නව ජනාවාස බිහි කිරීමේ දී ජනාශ්‍රිත නොවූ හුදකලා ප්‍රදේශවල සංවර්ධන කටයුතු වෙනුවෙන් අර්ධ වශයෙන් හෝ ශ්‍රමය ලබා ගැනීමයි. බෙදුම් හා ක්ෂේත්‍ර ඇළ මාර්ග තැනීම, සුළු වාරිමාර්ග ඉදිකිරීම, මංමාවත් ඉදිකිරීම සහ ප්‍රජා සංවර්ධන කාර්යයන්හි දී ජනාවාසකරුවන් සාමුහික වශයෙන් යෙදවීම ආරම්භයේ දී අපේක්ෂා කරන ලදි.

***මහවැලි සංවර්ධන ව්‍යාපාරය හා ඒ යටතේ සිදු වූ සංවර්ධන කාර්ය***

මහවැලි මහ සැලැස්මෙහි අන්තර්ගත සංවර්ධන කාර්යයන් කඩිනමින් නිම කළ යුතු බව 1977/10/12 දින තීර්ණය කරන ලද අතර ඒ අතුරින් වසර තිහකින් නිම කිරීමට අරමුණු කොට තිබූ මහවැලි ව්‍යාපාරයේ සැලැස්ම තෝරාගත් සංවර්ධන ව්‍යාපෘති කීපයක් යටතේ වසර හයක් තුළ නිම කිරීමට කඩිනම් සැලැසමක් පිළියෙල කරන ලදි (මහවැලි ව්‍යාපාරය හා අරමුණු 1998:39). .මේ යටතේ පොල්ගොල්ල වේල්ල, පොල්ගොල්ල - උකුවෙල උමග, උකුවෙල ජලවිදුලි බලාගාරය, බෝවතැන්න ජලාශය, බෝවතැන්න උමග, බෝවතැන්න ජල විදුලි බලාගාරය, හුරුළු පෝෂක ඇළෙහි ඉදිකිරීම්, දඹුලු ඔය ජලාශය, කණ්ඩලම ජලාශය සහ කළාවැව වම් ඉවුර යටතේ ජනාවාසකරණ කටයුතු ආරම්භ කරන ලදි.

වසර තිහකින් නිම කිරීමට අරමුණු කොට තිබූ මහවැලි මහ සැලැස්මෙහි සංවර්ධන කටයුතු 1977 වන විට ආරම්භ කොට තිබිණි. ඒ යටතේ කළාවැව වම් ඉවුර ආශ්‍රිත ව ජනාවාසකරණ කටයුතු ආරම්භ කර තිබිණි. 1970 දශකය පසු වන විට මෙරට ආර්ථිකමය වශයෙන් ගැටලු රාශියකට මුහුණ පා සිටි අතර සහල් ඇතුළු අත්‍යවශ්‍ය කෘෂි නිෂ්පාදන රාඥා පැවතියේ ආනයන මතයි. මේ අනුව ජනගහනයේ සිදු වූ වර්ධනයට සාපේක්ෂක ව ආර්ථික හා සමාජ ගැටලු රැසක් මෙම කාල පරිච්ඡේදය තුළ උද්ගත ව තිබූ බව පැහැදිලි වන අතර මහවැලි සංවර්ධන ව්‍යාපාරය ක්‍රියාත්මක වෙමින් පැවතියත් උක්ත ගැටලු විසඳාලීම සඳහා ඒවා ප්‍රමාණවත් නොවිණි.

මෙම ජනාවාසකරණ කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ආයතනික වෙනස්කම් රැසක් සිදු කිරීමට අවශ්‍ය විය. ඒ අනුව 1978 ඔක්තොම්බර් 07 දින මහවැලි සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවීම මෙහි වැදගත් පියවරකි (මහවැලි ව්‍යාපාරය හා අරමුණු

1998:41). 1979 අප්‍රේල් 19 දින ශ්‍රී ලංකා පාර්ලිමේනතුව විසින් සම්මත කරන ලද අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරි පනතෙන් (මහවැලි ව්‍යාපාරය හා අරමුණු 1998:62) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවනු ලැබී ය. මේ වන විට ක්‍රියාත්මක වෙමින් පැවති කාර්යභාරයන් හඳුනාගනිමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ප්‍රධාන ආයතන තුනක් ස්ථාපිත කරමින් සංවර්ධන කටයුතු වේගවත් කරන ලදි. මේ අනුව

1. ප්‍රධාන ජලාශ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය
2. මහවැලි පහළ නිම්න සංවර්ධන සැලසුම් නිර්මාණය කිරීම
3. නව ජනාවාසකරණ කටයුතු ආරම්භ කිරීම.

මේවා මහවැලි අධිකාරිය යටතේ එක ම ආයතනික ව්‍යුහයක් තුළ ක්‍රියාත්මක කරමින් කාර්යක්ෂම මහවැලි ව්‍යාපාරයක් අරමුණු කොට ගන්නා ලදි. මේ අනුව මහවැලි මහ සැලැස්මෙහි අන්තරගත ව තිබූ ජනාවාසකරණ කටුයතු ඇතුළු යටිතල පහසුකම් හඳුනාගනිමින් ඒවා පියවරින් පියවර ක්‍රියාත්මක කිරීම මහවැලි අකධිාරිය යටතට පැවරිණි. ශ්‍රී ලංකා මහවැලි ව්‍යාපාරයේ වැදගත් අවස්ථාවක් ලෙස මෙම ක්‍රියාදාමයන් හඳුනාගනු ලබනුයේ බහුවිධ සංවර්ධන කාර්යයන් හා සේවා පහසුකම් සැපයීම එක ම කළමනාකාරිත්වයක් යටතේ සිදු කරමින් මෙරටට නව සංවර්ධන ප්‍රවේශයක් හඳන්වාදීමේ හේතුව මත ය.

මහවැලි මහ සැලැස්මෙහි ජනාවාසකරණ කටයුතු සිදුකරනු ලැබුවේ භෞතික වාර්තාවේ නිර්දේශයන්ට අනුකූලවයි. නවක ලෙස සංවර්ධනය කරන මහවැලි එච් කලාපයේ වපසරිය පුළුල් කිරීම සඳහා ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබූ අතර ඉඩම් පරිහරන රටාවේ වෙනස්කම් හඳුනාගෙන නව ජනාවාස රටාවක් සැලසුම් කරන ලදි. මේ සඳහා සැලසුම් සකස් කිරීම බාර දී තිබුණේ හන්ටීන්ග්ස් ටෙක්නිකල් සර්විසස් (Huntings Technical Services) ආයතනය වෙතයි. මෙම ආයතනයේ නිර්දේශ අනුව ජනාවාසකරණ කටයුතු ආරම්භ කළ අතර එහි මූලික පදනම වූයේ ජනාවාසයන්හි පැරණි ජනාවාස ක්‍රමයේ සංවර්ධිත ස්වරූපයකි. පොකුරු ජනාවාස අරමුණු කොට ගනිමින් ජනාවාසකරුවන් අතර සමගිය, ස්ථාවරත්වය සහ සහයෝගිතාව ඇති කරමින් ජානපදිකයන් පදිංචි කරවීමයි. බාහිර වෙනත් ප්‍රදේශයකින් පැමිණි ජන කොටස් එක ම ගම්මානයක පදිංචි කරවීමට ප්‍රමුඛතාව ලබා දුන් අතර එම ගම්මාන කේන්ද්‍ර කරගත් ජනාවාස ඒකකයන්හි ප්‍රාථමික

පාසලක්, සමුපකාර වෙළඳසැලක් සහ තැපැල්හලක් වැනි යටිතල පහසුකම් සැපයීම ප්‍රමුඛ කාර්යයක් කොට ගන්නා ලදි.

නව ජනාවසකරණ ප්‍රතිපත්තියෙහි මීළඟ අදියර වූයේ ඉහතින් බිහි කළ ජනාවාස ඒකකය ගම්මාන කීපයක් කේන්ද්‍ර කරගත පොකුරු ගම්මාන ලෙස සංවර්ධනය කරමින් ඒ අශ්‍රිත ව සේවා මධ්‍යස්ථාන පහසුකම් සැලසීමයි. ගම්මානයක පවතින පහසුකම්වලට අමතර ව උපතැපැල් කාර්යාලයක්, කනිෂ්ඨ ද්විතියක පාසලක්, ග්‍රාම නිලධාරි කාර්යාලයක් සහ සෞඛ්‍ය මධ්‍යස්ථානයක් වැනි සේවා මධ්‍යස්ථාන පොකුරු ගම්මාන ආශ්‍රිත ව ස්ථාපිත කරනු ලැබේ. ජනාවාසකරණ රටාවෙහි ඉහළ ම ජනාවාස ඒකකය නාගරික සේවා මධ්‍යස්ථානයයි. ඒ යටතේ ජ්‍යෙෂ්ඨ ද්විතීයක පාසලක්, අරෝග්‍ය ශාලාවක්, පොලිස් ස්ථානයක්, බැංකු සහ මූල්‍ය ආයතන මෙන් ම අනෙකුත් සේවා ආයතන මේ තුළ ස්ථාපිත කොට ඇත.

මෙලෙස බිහි කළ ජනාවාසයන්හි භෞතික සැලසුම්වල මෙන් ම එහි ගුණාත්මකභාවයේ ද වර්ධනයක් දක්නට ලැබීම පොකුරු ජනාවාස ක්‍රමය ගමත් නගරයත් අතර මනා සබඳතාවක් ඇති කිරීමට සහ ආර්ථික හා සමාජීය සංවර්ධනයකට පදනම සකසනු ලැබී ය. පැරණි ජනාවාස ව්‍යාපාරයන්හි ජනපද හැඳින්වීමට යොදනු ලැබූ කොලනි යන නාමය වෙනුවට මහවැලි ව්‍යාපරය යටතේ නිර්මාණය වූ නව පොකුරු ජනාවාස ක්‍රමය යටතේ නව පරිපාලන ක්‍රමවේදයන් යටතේ ප්‍රදේශය හඳුන්වාදෙනු ලැබිණි.

මේ අනුව පැරණි ජනාවාස රටාව තුළ පැවති ප්‍රධාන ජනාවාස නිලධාරි තනතුර වෙනුවට නේවාසික ව්‍යාපාර කළමනාකාර කාර්යාලයක් ස්ථාපිත කොට ඒ යටතට ගොවි පවුල් ආසන්න වශයෙන් 200-250 අතර ඇතුළත් කොට ඒකකයක් නිර්මාණය කරමින් එම ඒකකයට අදාළ ව ඉඩම්, වාරිමාර්ග, කෘෂිකර්ම සහ ප්‍රජා කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා ඒකක කළමනාකරණ නිලධාරියෙක් පත්කරන ලදි.

ඒකක කීපයක් ඇතුළත් වන අකාරයට එනම් ගොවි පවුල් 2000 - 2500ත් අතර සංඛ්‍යාවකින් සමන්විත වන කොට්ඨාශයක් නිර්මාණය කරන ලදි. කොට්ඨාසය කොට්ඨාස කළමනාකරුවෙකු යටතේ ක්‍රියාත්මක වූ අතර එම තනතුර සඳහා උපදිසාපතිවරයෙකුට හිමි ඉඩම් බලතල ඇතුළත් කරන ලදි. කොට්ඨාස කළමනාකරණ කාර්යාලය යටතේ කෘෂිකර්ම, වාර්මාර්ග, ප්‍රජා කටයුතු ආදීය සැලසුම්

කොට ක්‍රියාත්මක කිරීම සහ ඒවා පහසු කරවීම සඳහා ඊට අනුයුක්ත ව ඉඩම් නිලධාරි, වාරි ඉංජිනේරු, කෘෂිකර්ම නිලධාරි සහ ප්‍රජා සංවර්ධන නිලධාරින්ගේ සේවාවන් ලබාදීමට කටයුතු කොට තිබිණි..

මෙවැනි කොට්ඨාශ කිහිපයක පරිපාලන ප්‍රදේශ ඇතුළත් වන පරිදි දිසාපති බලතල සහිත ව්‍යාපාර කළමනාකාරවරයෙකු පත් කළ අතර, ඉඩම්, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ප්‍රජා කටයුතු නියාමනය සඳහා නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකරවරයෙකුගේ සහය පරිපාලන වශයෙන් ලබාගන්නා ලදි. ඒකක කළමනාකාර තනතුර යටතේ මහවැලි මහ සැලස්ම අනුව නැවත පදිංචි කිරීම සමාජීය සහ ආර්ථික සංවර්ධන කටයුතු සිදු කරන ලදි.

මෙම පරිපාලන ව්‍යූහය කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරයෙහි ප්‍රගමනයට හේතු වූ අතර ශක්තිමත් ජනාවාසකරණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමටත් එහි ප්‍රතිලාභ ජනාවාසයන්හි පදිංචිකරුවන්ට ලබාගැනීමටත් හේතු සාධක වී ඇත.

## නිගමනය

මහවැලි සංවර්ධන වැඩපිළිවෙළ බහුකාර්ය යෝජනා ක්‍රමයක් වූ අතර ව්‍යාපෘතිය ආරම්භ කොට මේ වන විට දශක පහක් ඉක්ම ගොස් තිබේ. ජාතික වශයෙන් මහවැලි ව්‍යාපාරය ඔස්සේ අරමුණු රාශියක් සපුරාගෙන ඇත. කෘෂිකර්ම සංවර්ධනය රැකුලක් ලබාදීම, ඉඩම් නොමැති ජනතාවට වාරි පහසුකම් සහිත ඉඩම් ලබාදීමෙන් ජනාවාසකරුවන්ගේ අදායම් තත්ත්වය ඉහළ නැංවීමට කටයුතු කොට තිබේ. මේ යටතේ (අ) කෘෂිකාර්මික සංවර්ධනයට රැකුලක් ලබාදීම, (ආ) ඉඩම් නොමැති ජනතාවට වාරි පහසුකම් සහිත ඉඩම් ලබාදීම, (ඇ) ජනතාවගේ අදායම් තත්ත්වය ඉහළ නැංවීම, (ඈ) ජාතික ආර්ථිකයට දායක වීම මූලික ඉලක්ක බවට පත් ව තිබේ.

ශ්‍රී ලංකා රජයේ වත්මන් ආර්ථික ප්‍රමුඛතාව මත මහවැලි සංවර්ධන වැඩපිළිවෙළ යටතේ වාරිමාර්ග සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට ඇත. ජල සම්පත කළමනාකරණය කිරීමෙන් වාරිමාර්ග සංවර්ධනයෙහි ඵලදායිතාව ඉහළ නැංවීම මෙහි මූලික අරමුණු බවට පත් ව තිබේ. 1970 දශකයේ දී ආරම්භ වූ මහවැලි ව්‍යාපාරය වර්තමානය වන විට එහි ආරම්භක ගැටලු හඳුනා ගනිමින් ව්‍යාපෘති රැසක් හඳුනවා දී තිබේ. නිදහසුනක් ලෙස මහවැලි එච් කලාපයේ ජනතාව පදිංචිකරීමේ දී මතු වූ ඉඩම් ගැටළු, පාරම්පරික වැසියන් නො සලකා හැරීම සම්බන්ධ සමාජීය

ගැටලු සහ ජල කළමනාකරණය සම්බන්ධ ගැටලුවලින් ලද අත්දැකීම් මහවැලි සී සහ බී කලාප ජනාවාසකරණයේ දී හඳුනාගනිමින් ඒවා අවම කිරීමට කටයුතු කොට තිබීම.

මහවැලි සංවර්ධන ව්‍යාපාරයෙහි ප්‍රගතිය හඳුනාගැනීමේ දී කිසියම් කාල රාමුවකට හෝ වර්ෂ කිහිපයක් තුළ පමණක් ඇගයීමකට ලක් කරමින් තක්සේරු කිරිම ප්‍රඥා ගෝචර ක්‍රියාවක් නො වේ. එයට හේතුව බහුකාර්ය යෝජනා ක්‍රමයක් මඟින් බිහි වන සමාජ ආර්ථික ප්‍රතිලාභ පරම්පරා ගණනාවක් අනාගතයට ගමන් කිරීමයි. කෘෂිකාර්මික හා වාරිමාර්ග සංවර්ධනයට වර්තමානයේ කරනු ලබන ආයෝජන මගින් ඉදිරි අනාගත කාලය තුළ අඛණ්ඩ ප්‍රතිලාභ බිහි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ හා නාමාවලිය

අයිවර්ස්. ආර්. ඩබ්ලිව්. 1899 (2004). *උතුරු මැද පළාත් අත්පොත නොහොත් එදා වැව් බැදි රාජ්ජේ*, පරි. එම්. යූ. ඒ.  තෙන්නකෝන්, වර්ෂා තෙන්නකෝන්, කොළඹ, ගොඩගේ සහ සහෝදරයෝ.

කිරිබමුණේ, ඔස්., (1984,) මහවැලි නිම්නය දේශපාලන කේන්ද්‍රස්ථානයක් වීම. *මහවැලි වංශය*, 1 කාණ්ඩය. (සංස්.) ඩී. ඇම්. ජී. ඒකනායක, කොළඹ මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය.

ගයිගර්. ඩබ්ලිව්. (1969) *මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය*, පාරි. ආරියපාල, ඇම්. බී. කොළඹ ඇම්.වී. ගුණරත්න හා සමාගම

නිකොලොස්. සී. ඩබ්ලිව්. (1964) ජල සම්පාදනය, *ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසය*, කාණ්ඩය 1 එක විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය 213-217 පිටු.

නිකොලොස්. සී. ඩබ්ලිව්. (1979), *පුරාතන හා මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තරය*,  රාජකීය ආසියාතික සමිතියේ ශ්‍රී ලංකා ශබඩාවේ සඟරාව,  පරිවර්තනය.

මද්දුමබන්ඩාර, සී. එම්. (1984) මහවැලි ප්‍රභවය හා භූගෝලීය පදනම, *මහවැලි වංශය*, i කාණ්ඩය, කොළඹ, මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය.

*මහවැලි වංශය*  i සහ ii කාණ්ඩ. (1984), මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය.

*මහවැලි ගඟ සංවර්ධන ව්‍යාපාරය එදා අද සහ හෙට*, (1998) මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ආයතනය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

රත්නායක, ඇම්., (1989), *ප්‍රාදේශීය සංවර්ධන උපාය මාර්ගයක් ලෙස මහවැලි එච් කලාපයේ විවතාව*, අප්‍රකාශිත ශාස්ත්‍රපති නිබන්ධනය, භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය.

විතානාච්චි, සී. ආර්. (2014), *පුරාණ ශ්‍රී ලංකාවේ අමුණු නිර්මාණය සහ තාක්ෂණය පිළිබඳ සමාජ පුරාවිද්‍යා විමර්ශනයක්*, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්ව විද්‍යාලය, අප්‍රකාශිත

සිරිවීර ඩබ්. අයි. (2002), *රජරට ශිෂ්ටාචාරය සහ නිරිත දිග රාජධානිය*, මරදාන, දයාවංශ ජයකොඩි සහ සමාගම

Arumugam, S., (1969), *Water Resources of Ceylon*, Colombo, Water Resources Board Publication

Brohier R.L., 1934 (1979), *Ancient Irrigation Works in Ceylon*. Part i-iii Colombo, Ministry of Mahaweli Development.

Cooray, P.G., (1984), *An introduction to the Geology of Sri Lanka (Ceylon)*, Colombo, Museums of Sri Lanka.

Vidanapathirana, P. (2012) *Settlement pattern of the Malvathu Oya and Kala Oya Basins*, Colombo: Postgraduate Institute of Archaeology, University of Kelaniya.

Withanachchi, S.S., et al, 2014, Water resource management in dry zonal paddy cultivation in Mahaweli River Basin, Sri Lanka: An analysis of spatial and temporal climate change impacts and traditional knowledge, *Climate* 2 (4), 329-354